# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது **DSD/HO/06/EP/10 – 200,000 – 2021 රැ.වෘ.පුහුණු**

ඔබේ අංකය / உமது இல / **Your No** ............................................

දිනය / திகதி / **Date** 2021.09.22

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කලමණාකරුවන් / සංවර්ධන නිලධාරීන්

**අලෙවි අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පිළිබඳව Zoom තාක්ෂණය ඔස්සේ 2021.09.16 හා 17 දිනයන්හි පැවති සාකච්ඡාව සම්බන්ධවයි.**

2021.09.16 හා 17 දිනයන්හි අලෙවි අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය පිළිබඳව Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වූ සාකච්ඡාව සඳහා, පවත්නා කොවිඩ් 19 හදිසි ආපදා තත්වය යටතේ වුවද සෑම දිස්ත්‍රික්කයකින්ම අදාළ සියලුම නිලධාරීන් සහභාගී වී සහයෝගය දැක්වීම සතුටට කරුණකි.

02. එම සාකච්ඡාවේදී ඒ ඒ දිස්ත්‍රික්කයන්හි නිලධාරීන් ඉදිරිපත් කළ අදහස් අනුව මේ වන විටත් සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන 2021 - රැකියාභිමුඛ වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ සිදු කරනු ලබන පුහුණු වැඩසටහන් වර්තමානයේ පවත්නා Covid 19 ආපදා තත්වය හමුවේ ක්ෂේත්‍රය තුළ සිදු කිරීමේ අපහසුතාවයන් මතුව ඇති නිසා එම වැඩසටහන පහත ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙන ලෙසට යෝජනා හා අදහස් ඉදිරිපත් විය.

- ජන ජීවිතය යථා තත්වයට පත් වන තුරු රැකියාභිමුඛ වෘත්තීය පුහුණු පාඨමාලාවන්ට අදාළ න්‍යායාත්මක ඉගැන්වීම් කටයුතු ප්‍රමාදයකින් තොරව Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ජන ජීවිතය යහපත් වූ විගස න්‍යායාත්මක ඉගැන්වීම් අවසානයේ පැවැත්විය යුතු අදාළ ප්‍රායෝගික පුහුණු ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- මෙම කටයුතු මුලු දිවයිනම ආවරණය පරිදි එකම ආකාරයකට පැවැත්වීම වඩාත් සුදුසු නිසා ඒ ඒ ආයතන හා දිස්ත්‍රික්කවල පිහිටි ශාඛාවන් මගින් එකම ආකාරයකට ඉගැන්වීම් කටයුතු සිදු කිරීම පිළිබඳව දැනුවත් කිරීම.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

03. මේ වන විටත් ඔබ විසින් ඉදිරිපත් කළ මෙම යෝජනා හා අදහස් පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්තුමා දැනුවත් කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇති බැවින් රැකියාභිමුඛ වෘත්තීය පුහුණු වැඩසටහන්හි න්‍යායාත්මක ඉගැන්වීම් කටයුතු පමණක් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට අවශ්‍ය අවසරය ලබා දිය හැකිය. මෙම කටයුතු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් නිසි නියාමනයන් ඔස්සේ ඉටු කිරීම වඩාත් සුදුසුය.

ඒ අනුව ඉහත ක්‍රමවේදය ඔස්සේ සුදුසු පරිදි රැකියාභිමුඛ වෘත්තීය පුහුණු කටයුතු සුදුසු පරිදි සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

රැකියාභිමුඛ වෘත්තීය පුහුණු වැඩසටහන හා අනෙකුත් සියලුම අලෙවි සංවර්ධන වැඩසටහන් සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි.

එම්. ජී. එස්. එස්. කිත්සිරි,
අධ්‍යක්ෂ (අලෙවි) රා. ආ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.